# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) - 11 - 2449823
වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ටීඕ/ඩීඊඑෆ්/30 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2008.03.03 |

භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක: 01/2008

අමාත්‍යාංශ ලේකම්වරුන් / පළාත් සභා ලේකම්වරුන්,
රජයේ බැංකු සභාපතිවරුන් / සංස්ථා හා මණ්ඩල ප්‍රධානීන් සහ
රජයේ සමාගම් වල සභාපතිවරුන්.

**රජයේ හා රජයට අනුබද්ධ ආයතන විසින් කරනු ලබන බැංකු තැන්පතු රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කිරීම හා අනෙකුත් කෙටි කාලීන ආයෝජන**

රාජ්‍ය ආයතන සතු අතිරික්ත අරමුදල් රජයේ බැංකු වෙත පමණක් ආයෝජනය කළ යුතු බවට විධිවිධාන පනවන ලද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක 25 දරණ 2004 ජුනි මස 29 වන දිනැති චක්‍රලේඛයට සහ එහි සංශෝධනයන්ට වැඩිමනත් වශයෙනි.

02. රජය විසින් සෘජුව හෝ වක්‍රාකාර ලෙස අරමුදල් සපයනු ලබන ආයතන හා රජය වෙත සෘජු හෝ වක්‍ර ලෙස අවසාන වගකීම පැවරෙන අරමුදල් වල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ජාතික ආර්ථිකයට වඩාත් යහපත් ප්‍රතිඵල ගෙනදෙන හා එම ආයතන වල හෝ ප්‍රතිලාභීන්ගේ අරමුදල් වල සුරක්ෂිතතාවය රැකෙන විධිමත් ආයෝජන පිළිවෙතක් අනුගමනය කළ යුතු යැයි අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත.

03. මේ අනුව රජයේ සියළුම අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ පළාත් සභා/ සංස්ථා හා මණ්ඩල විසින් පාලනය කරනු ලබන අරමුදල් ආයෝජනය කිරීමේදී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු යැයි නියම කරනු ලැබේ.

I. රාජ්‍ය බැංකු හැර වෙනත් කිසිදු මූල්‍ය ආයතනයක රජයට සෘජුව හෝ වක්‍රව බැඳීමක් ඇති අරමුදල් ආයෝජනය කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවිය යුතුය.

II. රාජ්‍ය බැංකුවකින් තවත් රාජ්‍ය බැංකුවකට හෝ රජයේ මූල්‍ය ආයතනයකට තැන්පත් මාරු කිරීම නොකළ යුතුය.

III. දැනට රාජ්‍ය බැංකු වල හෝ භාණ්ඩාගාර බිල්පත් වල හෝ භාණ්ඩාගාර බැඳුම්කර වල කිසියම් ආයෝජනයක් කර ඇත්නම් එම මුදල් මාරු කිරීම නොකළ යුතුය.

IV. ඉහත III හි සඳහන් ආයෝජන කල්පිරුන විට නැවත ආයෝජනය කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව හා භාණ්ඩාගාරය විසින් මැදිකාලීන ආයෝජන සඳහා ගෙවනු ලබන පොලී අනුපාතයට යටත්ව වසර දෙකකට හෝ ඊට වැඩි කාලපරිච්ඡේදයක් සඳහා වන බැංකු තැන්පතු හෝ භාණ්ඩාගාර බැඳුම්කර වලය.

V. අදාළ ආයතන හා අරමුදල් සිය අවශ්‍යතාවයන් සඳහා එම ආයෝජනයන්ගෙන් ආපසු ලබාගත යුත්තේ ආයෝජන මත වන පොලී ආදායම හා/හෝ අරමුදල් වලින් ගෙවීමට ඇති ප්‍රාග්ධන ගෙවීම් සඳහා අවශ්‍ය කෙරෙන මුදල් පමණි.

VI. රාජ්‍ය බැංකු හා මූල්‍ය ආයතන රටේ සාමාන්‍ය පොලී අනුපාත අඩුකිරීම් සඳහා ක්‍රමානුකූල වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුවේ. රාජ්‍ය බැංකු හා ඒවායේ පරිපාලිත ආයතන ද, රාජ්‍ය මූල්‍ය ආයතන අරමුදල් එකිනෙකා අතර සදාචාරාත්මක නොවන තරඟකාරීත්වයක් නොකළ යුතුය. මෙම ආයතන විසින් සිය සේවා වැඩිදියුණු කරමින් හා වියදම් අඩු කාර්යක්ෂම සේවා සැපයීමෙන් තරඟකාරීත්වයට මුහුණදීම, අනවශ්‍ය ලෙස පොලී වැඩි කරමින් තැන්පතු/ආයෝජන ඇද ගැනීමට දරණ ප්‍රයත්නයන්ට වඩා අර්ථවත් වේ.

04. රාජ්‍ය සංස්ථා හා ආයතන වල පවත්වාගෙන යන පෞද්ගලික අර්ථසාධක/විශ්‍රාම හෝ සේවකයින්ට බලපාන පෞද්ගලික අරමුදල් සඳහා මෙම චක්‍රලේඛය අදාළ නොවේ. එහෙත් එවැනි අරමුදල් රාජ්‍ය සංස්ථා/ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩල විසින් කළමනාකරණය කරන්නේ නම් එම මුදල් වල සුරක්ෂිත භාවය රැකේ යැයි සෑහීමකට පත්විය හැකි මූල්‍ය ආයතන වල පමණක් එම මුදල් ආයෝජනය කිරීමට වග බලාගත යුතු අතර, රාජ්‍ය බැංකු හා මූල්‍ය ආයතන ඒ සඳහා නුසුදුසු වන්නේ කවර හේතුන් මතද යන්න තක්සේරු කළ යුතුය.

05. ඉහත විධිවිධාන වහාම ක්‍රියාත්මක වන පරිදි ක්‍රියාත්මක කළ යුතු යැයි 2008 ජනවාරි මස 31 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇති බැවින් අදාළ විධිවිධාන ඔබ අමාත්‍යාංශය/ආයතනය යටතේ ක්‍රියාත්මක වන සියළු ආයතන විසින් නිසි පරිදි ඉටු කරන බවට සොයා බලනු ඇතැයි අපේක්ෂා කරමි. රාජ්‍ය බැංකු හා මූල්‍ය ආයතන සභාපතිවරුන් හා සාමාන්‍යාධිකාරිවරුන් මෙම උපදෙස් ප්‍රාදේශීය හා ශාඛා මට්ටමින් ක්‍රියාත්මක කළ හැකි වන පරිදි වැඩ පිළිවෙලක් සකසා අධීක්ෂණය කළ යුතුය. මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේදී යම් ගැටළු අවස්ථාවන් උද්ගතවුවහොත් ඒ සම්බන්ධව මගේ අවධානයට හෝ අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් ගේ අවධානයට යොමු කළ හැක.

පී.බී.ජයසුන්දර
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.